**වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම - 2021/ 2022**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා  වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ප්‍රධාන විධායක නිලධාරී, ගණකාධිකාරී සහ සහකාර ගණකාධිකාරී ඇතුළු සේවකයින් තිදෙනෙකු සඳහා වාර්ෂික ප්‍රසාද දීමනාව ගෙවීම. | 1,333,000 | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ අනෙකුත් අදාළ ලියකියවිලි | සම්මතයක් ලෙස වෙස්ට් කෝස්ට් (පුද්ගලික) සමාගම පසුගිය කාල සීමාව තුළ කාර්ය සාධනය මත පදනම් වූ ප්‍රසාද දීමනා යෝජනා ක්‍රමයක් අනුගමනය කර ඇත. ප්‍රධාන විධායක නිලධාරී විසින් වසරකට වරක් සමාගමේ කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ කාර්යසාධනය තක්සේරු කර ගෙවිය යුතු ප්‍රසාද දීමනාව තීරණය කරයි. | විගණනය සඳහා ලේඛන සැපයිය යුතුය. |

## 1.6 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු රු.19,457,255,454 ක මුදලක් වසරකට වැඩි කාලයක් නිරවුල් නොවී ඉතිරිව පැවතුනි. | වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ පියවීම් ඉතා දුර්වල මට්ටමක පැවතුනි. සමාගම මේ බව ලංකා විදුලිබල මණ්ඩලයට කිහිප වතාවක්ම දන්වා ඇති අතර විදුලි ගාස්තු සංශෝධනය කිරීමෙන් පසු ලංකා විදුලිබල මණ්ඩලය ඔවුන්ගේ පියවීම් ඉහළ නංවනු ඇතැයි අපි අපේක්ෂා කරමු. | ප්‍රමාදයකින් තොරව අයකරගත යුතු මුදල් අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය සඳහා වන මාර්ගෝපදේශ සහ මෙහෙයුම් අත්පොත පිළිබඳ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |

| | | | |
|---|---|---|---|
| මෙහෙයුම් අත්පොත<br>(අ) 3.1 වගන්තිය | රජය සතු සියලුම ව්‍යවසායන් තම සේවක සංඛ්‍යාව සහ වේතන සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය. සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් වී තිබුණි. | මෙම සමාගම යුගදනව් බලාගාරය හිමිකර ගැනීමේ තනි අරමුණක් සහිතව පිහිටුවා ඇති සමාගමකි. විදුලිබල මණ්ඩලය සමඟ අත්සන් කරන ලද බලශක්තිය මිලදී ගැනීමේ ගිවිසුමේ අවශ්‍යතා අනුව, බලාගාරයේ සම්පූර්ණ මෙහෙයුම්, කොන්ත්‍රාත්කරුවෙකු විසින් සිදු කරනු ලැබේ. එබැවින්, සමාගමේ සේවකයින් ලෙස සිටිනුයේ ප්‍රධාන විධායක නිලධාරී, ගණකාධිකාරී සහ සහකාර ගණකාධිකාරී පමණි. සමාගමේ අයවැය පාලන ක්‍රියාවලියට අනුව ඔවුන්ගේ වේතනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. වර්ෂය තුළ නව බඳවා ගැනීම් හෝ ඉල්ලා අස්වීම් සිදු නොවීය. සමාගමේ මානව සම්පත් කළමනාකරණය සඳහා වන පරිච්ඡේදයක් ඇතුළත් මෙහෙයුම් අත්පොත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ආ) 3.2 (i) වගන්තිය | සමාගම විසින් එක් එක් තනතුර සඳහා බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටියක් සකස්කර නොතිබුණි. | මෙම සමාගම සඳහා මෙම චක්‍රලේඛයෙන් යෝජනා කර ඇති පරිදි යෝජනා ක්‍රමයක් සකස් කිරීම ප්‍රායෝගික නොවේ. | - එම - |
| (ඇ) 6.2 වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කරන ලද ආයෝජන ප්‍රතිපත්තියට අනුකූලව ආයෝජන කමිටුවක්, පසුගිය වසර දෙක තුළ අවම වශයෙන් වසරකට රුපියල් බිලියන 30 ක ස්ථාවර ආදායමක් ඇති රජය සතු ව්‍යවසායයන්හි අධ්‍යක්ෂ මණ්ඩලයන් විසින් පිහිටුවිය යුතුය. සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් වී තිබුණි. | අතිරික්ත අරමුදල්, ස්ථාවර තැන්පතු ලෙස බැංකුවේ ආයෝජනය කිරීම සඳහා කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබුණි. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | 7.5 වගන්තිය | රජය සතු ව්‍යවසායයන් විසින් මාසික, කාර්තුමය සහ වාර්ෂික කාර්යසාධන වාර්තා අදාළ ආකෘතියෙන් යුතුව අවශ්‍ය පරිදි රේඛීය අමාත්‍යාංශයට සහ මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුය. සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් වී තිබුණි. | මහා භාණ්ඩාගාරය විසින් සමාගම තුළ කිසිදු මුදලක් ආයෝජනය කර නොමැති අතර මෙම ආයෝජනය විදේශ ණයක් මගින් මූල්‍යනය කිරීමේ අරමුණින් සිදුකර ඇති අතර එම ණය මේ වන විට පියවා ඇත. මෙම තොරතුරු කළමනාකාරිත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිතිපතා සපයනු ලැබේ. | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.18,811,281,941 ක ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ ඊට අනුරූප ලාභය රු. 15,574,865,319 ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,236,416,622ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රධානතම හේතුව වන්නේ ලැබිය යුතු විදේශ මුදල් මත විනිමය ලාභය ඉහළ යාමයි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

අ. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම සියයට 16 කින් පහළ ගොස් තිබුණි. එයට සමගාමීව, විකුණුම් පිරිවැය සියයට 24 කින් අඩු වී ඇති අතර සමාලෝචිත වර්ෂය සඳහා දළ ලාභය සියයට 2 කින් අඩු වී තිබුණි.

ආ. සමාගමේ මූල්‍ය ආදායම සියයට 116 කින් ඉහළ ගොස් ඇති අතර සමාගමේ මූල්‍ය පිරිවැය සියයට 3 කින් ඉහළ ගොස් තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

අ. සමාගමේ දළ ලාභ අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 37 සිට සියයට 43 දක්වා ඉහළ ගොස් ඇති අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව ශුද්ධ ලාභ අනුපාතය සියයට 35 සිට සියයට 50 දක්වා ඉහළ ගොස් තිබුණි.

ආ. හිමිකම් මත ප්‍රතිලාභය, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 21 සිට සියයට 23 දක්වා වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ කාර්යයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බලශක්තිය මිලදී ගැනීමේ ගිවිසුම ප්‍රකාරව විදුලිබලය නිපදවීම සම්බන්ධයෙන් සමාගම විසින් නිකුත් කරන ලද මාසික ඉන්වොයිසි ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) විසින් සමාලෝචනය කර තිබුණු අතර, බොහෝ අවස්ථාවලදී ලංවිම විසින් පිළිගත් මුදල ඉන්වොයිස් කරන ලද | වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය අතර ඇති කරගත් බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමේ 8.10.2 වගන්තිය ප්‍රකාරව, "යම් ඉන්වොයිසියක නිශ්චිතව දක්වා ඇති යම් මුදලක් සම්බන්ධයෙන් ගැටළුවක් ඇති වුවහොත්, එම ඉන්වොයිසිය ලැබීමෙන් දින හතක් ඇතුළත, අනෙක් පාර්ශවයට | අදාළ පාර්ශ්වයන්ගේ සම්බන්ධීකරණයෙන් ගැටළුව විසඳීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| ප්‍රමාණයට වඩා අඩු වී තිබුණි. මෙම වෙනසට බලපෑ හේතු ඉදිරිපත් නොකර එකඟ වූ මුදල ලංවීම විසින් තහවුරු කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මෙම ගැටළුව සඳහා විසඳුමක් ලබා ගැනීමට සමාගම අපොහොස් වී තිබුණි. | දැනුම් දිය යුතු අතර, නියමිත දිනට හෝ ඊට පෙර එම ඉන්වොයිසියෙහි කිසියම් ගැටළු රහිත මුදලක් ගෙවිය යුතුය". කෙසේ වෙතත්, වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම වෙත මාසික ඉන්වොයිසියෙන් දින හතක් ඇතුළත ගැටළු සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් ලිඛිත දැනුම්දීමක් මෙතෙක් ලැබී නොමැත. ලංකා විදුලිබල මණ්ඩලය මගින් ගෙවීම සඳහා බැංකු උපදෙස් ලැබීමෙන් පසු, වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම විසින් විචලනයන් සඳහා හේතු විමසමින් සෑම විටම ලංකා විදුලිබල මණ්ඩලය වෙත නිල වශයෙන් ලිඛිතව දන්වා යවා ඇත. ගැටළුව විසඳීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය දායක නොවීම පිළිබඳව භාණ්ඩාගාර ලේකම්වරයා දැනුවත් කිරීමට 2022 ජූනි 15 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කළේය. තවද, සෑම විටම මතභේදයට තුඩු දී ඇති මුදල් සඳහා 50% ක හානිකරණයක් මණ්ඩලය විසින් ලබා දී ඇත. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 උපායමාර්ගික සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය සඳහා වන මාර්ගෝපදේශ පිළිබඳ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.3 වගන්තියට ප්‍රකාරව, ජාතික ප්‍රතිපත්ති රාමුවක් තුළ තම අනිවාර්ය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එහි උපායමාර්ගික සැලැස්ම සකස් කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය. ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සමඟ සකස් කරන ලද උපායමාර්ගික සැලැස්ම අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල් වෙත අදාළ පරිදි ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම ඉහත අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් වී තිබුණි. | මහා භාණ්ඩාගාරය සමාගම තුළ කිසිදු අරමුදල් ආයෝජනයක් සිදු කර නොමැති අතර එහි ආයෝජනය කර ඇත්තේ සම්පූර්ණයෙන්ම පියවා ඇති විදේශ ණයක් මගින් බලාගාරයේ මූල්‍යකරණය සඳහා පමණි. මෙම තොරතුරු කළමනාකාරිත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිතිපතා සපයනු ලැබේ. | අදාළ මාර්ගෝපදේශ හා චක්‍රලේඛ වලට අනුකූල විය යුතුය. |

### 4.2 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 4.4 වගන්තිය ප්‍රකාරව සියලුම රාජ්‍ය ව්‍යවසායන් සඳහා විගණන කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලයට පමණක් වාර්තා කරන අභ්‍යන්තර විගණකවරුන් සිටිය යුතුය. රාජ්‍ය ව්‍යවසායක විගණන කමිටුව අධීක්ෂණ කාර්යයට පහසුකම් සැලසීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරන බව එම මාර්ගෝපදේශයේම 4.2 වගන්තියේ දැක්වේ. විධායක නොවන අධ්‍යක්ෂවරුන් 3 දෙනෙකුගෙන් හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් 1/3 කින් ඉහළ අගයෙන් සහ අවම වශයෙන් එක් සාමාජිකයෙකු හෝ මූල්‍ය කළමනාකරණය පිළිබඳ දැනුම හා සුදුසුකම් සහිතව අයෙකුගෙන් විගණන කමිටුව සමන්විත විය යුතු අතර, එයින් එක් සාමාජිකයෙකු විගණන කමිටුවේ සභාපතිවරයා ලෙස පත් විය යුතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය භාණ්ඩාගාර නියෝජිතයෙකුගෙන් සමන්විත වන සෑම අවස්ථාවකම එම සාමාජිකයා විගණන කමිටුවට පත් කළ යුතුය. සමාගම ඉහත අවශ්‍යතාවලට අනුකූල නොවීය. | ව්‍යවස්ථාපිත විගණනය මෙම ක්‍රියා පටිපාටි සහ අයවැයට අනුකූල වීම පිළිබඳ විගණන කටයුතු ආවරණය කරයි. සමාගමේ සමස්ත කාර්ය මණ්ඩලය පුද්ගලයන් 3 දෙනෙකුට සීමා වී ඇති අතර සමාගම වගකිව යුත්තේ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙන් ඉන්ධන තොග වශයෙන් මිලදී ගැනීමට, රසායනික ද්‍රව්‍යවලට සහ වාර්ෂික ව්‍යවස්ථාපිත ගෙවීම්වලට පමණි. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

### 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) පිළිබඳ එක්සත් ජාතීන්ගේ "2030 න්‍යාය පත්‍රයට" අනුව සියළුම රාජ්‍ය ආයතන එහි විෂය පථය යටතේ ඉලක්ක සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට දායක විය යුතුය. කෙසේ වෙතත්, සමාගම තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳව දැනුවත්ව නොසිටි අතර සාක්ෂාත් කරගත යුතු ඉලක්ක, එම ඉලක්ක සපුරා ගැනීමේ හිඩැස් සහ ප්‍රගතිය මැනීමට සුදුසු දර්ශක හඳුනාගෙන නොතිබුණි. | මෙගාවොට් 300 ක කේරවලපිටිය විදුලි බලාගාරය සමාගම සතු වන අතර සමාගම විසින් එහි මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබයි. සමාගමේ එකම කාර්යය එයයි. මිලදී ගත් ඉන්ධන සඳහා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවීම් සිදු කිරීමට සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මෙහෙයුම් හා නඩත්තු කොන්ත්‍රාත්තුව අනුව හා උපකරණ සැපයුම්කරු විසින් නිර්දේශ කරන ලද ඇතැම් රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීමට පමණක් එහි ගනුදෙනු සීමා වේ. මෙම එක් එක් ක්‍රියාකාරකම් සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි පවතියි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියා පටිපාටි අනුමත කරනු ලබයි. විදුලිබල බලාගාරයේ ඕනෑම වැඩිදියුණු කිරීමක් සඳහා වන ප්‍රාග්ධන අයවැය ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබයි. | සමාගම තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ "2030 න්‍යාය පත්‍රයේ" අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |